# කටාන ප්‍රාදේශීය සභාව

## කොන්ත්‍රාත්කරුවන් හා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2025

2025 වර්ෂය සඳහා මෙම ආයතනයට පහත සඳහන් ද්‍රව්‍ය හා සේවාවන් සැපයීම හා ඉදිකිරීම් සිදු කිරීම පිණිස ලියාපදිංචි වීමට අපේක්ෂිත සුදුසුකම් ලත් පිළිගත් නිෂ්පාදකයින්ගෙන්, සැපයුම්කරුවන්ගෙන් හා කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ඔබ විසින් සකස් කළ අයදුම්පත් පුරවා අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ "කොන්ත්‍රාත් හා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම 2025" යනුවෙන් සඳහන් කර "ලේකම්, කටාන ප්‍රාදේශීය සභාව, දෙමංහන්දිය." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හැකිය.

එක් එක් අයිතමයන් වෙනුවෙන් වෙන වෙනම ලියාපදිංචි ගාස්තු ගෙවිය යුතු අතර ආයතනයට පැමිණ ලියාපදිංචි වීමට අපේක්ෂා කරන්නන්ට සතියේ සඳුදා සිට සිකුරාදා දක්වා වූ රාජකාරි දිනවලදී පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා කාලය තුල දෙමංහන්දිය පිහිටි ප්‍රධාන කාර්යාලයට පැමිණ මුදල් ගෙවා ලියාපදිංචි විය හැක. තැපැල් මඟින් අයදුම් කරන්නේ නම් "ලේකම්, කටාන ප්‍රාදේශීය සභාව" යන නමට ලියන ලද චෙක්පතකින් පමණක් ගෙවීම සිදු කළ යුතුය.

**<u>ලියාපදිංචි කිරීමේ ගාස්තු.</u>**

| | |
|---|---|
| භාණ්ඩ සැපයුම් | : රු.2000.00 |
| සේවා සැපයීම | : රු.2000.00 |
| කොන්ත්‍රාත් C (01) | : රු.5000.00 |
| කොන්ත්‍රාත් C (02) | : රු.10000.00 |

**<u>A භාණ්ඩ සැපයීම.</u>**

| අයිතම අංකය | විස්තරය | අයිතම අංකය | විස්තරය |
|---|---|---|---|
| A (01) | කාර්යාලීය ලිපි ද්‍රව්‍යය හා කඩදාසි.<br>ආකෘති පත්‍ර මුද්‍රිත ලේඛණ | A (11) | නිළ ඇඳුම්, සපත්තු, මේස රෙදි, තිර රෙදි හා බුමුතුරුණු. |
| A (02) | කාර්යාලීය උපකරණ.<br>දැව හා වානේ කාර්යාලීය ගෘහ භාණ්ඩ | A (12) | මාර්ග නඩත්තු උපකරණ (රේක්ක, උදළු, විල්බැරෝ වැනි) |
| A (03) | කොන්ක්‍රීට් භාණ්ඩ<br>හාඩ්වෙයාර් අයිතම<br>තීන්ත වර්ග (වාහන සහ ගොඩනැගිලි සඳහා) | A (13) | කසළ කරත්ත |
| A (04) | වාහන අමතර කොටස් හා ලිහිසි තෙල් | A (14) | ප්ලාස්ටික් කසළ බඳුන්, කොම්පෝස්ට් බඳුන් සහ පානීය ජල ටැංකි |
| A (05) | ටයර් සහ ටියුබ් | A (15) | රෙඩිමික්ස් කොන්ක්‍රීට් |
| A (06) | ගංගා වැලි, කළු ගල්, මාර්ග තැනුම් ද්‍රව්‍ය, පස් හා බොරළු (බලපත්‍ර හිමියන් විය යුතුයි.) | A (16) | පරිගණක හා පරිගණක උපාංග (ප්‍රින්ටර්, යූ.පී. එස්. යන්ත්‍ර, ටෝනර්, රිබන් ආදී..) |
| A (07) | කාර්යාලීය හැඳුනුම්පත් | A (17) | වීථි ලාම්පු සහ විදුලි උපකරණ |
| A (08) | සනීපාරක්ෂක ද්‍රව්‍යය. (විෂබීජ නාශක හා සබන්) | A (18) | තාර හා කෝලාස් |
| A (09) | බැටරි | A (19) | වෛද්‍ය උපාංග හා උපකරණ |
| A (10) | සනීපාරක්ෂක උපකරණ (ඉදල්, කොසු, ගන් බූට්ස්, රබර් ග්ලවුස් ආදී..) | | |

## B සේවාවන්

| අයිතම අංකය | විස්තරය | අයිතම අංකය | විස්තරය |
|---|---|---|---|
| B(01) | පරිගණක, ප්‍රින්ටර් (මෘදුකාංග හා දෘඩාංග) හා පරිගණක උපාංග අළුත්වැඩියාව හා නඩත්තුව. | B(13) | මුද්‍රණ කටයුතු |
| B(02) | රථ වාහන අළුත්වැඩියාව හා සේවා කිරීම්. | B(14) | ඩිජිටල් බැනර් මුද්‍රණය.<br>නිල මුද්‍රා දින මුද්‍රා සකස් කිරීම. |
| B(03) | යන්ත්‍ර අළුත්වැඩියාව, නඩත්තුව හා සේවා කිරීම. | B(15) | වැඩසටහන් සඳහා ආහාර හා පාන සැපයීම හා කේටරින් සේවා |
| B(04) | ත්‍රීවිල් රථ අළුත්වැඩියාව සහ සේවා සැපයීම. | B(16) | භාෂා පරිවර්තන කටයුතු |
| B(05) | වානේ කැබිනට් හා වානේ අල්මාරි අළුත්වැඩියා කිරීම හා කාර්යාලීය දැව භාණ්ඩ අළුත්වැඩියා කිරීම. | B(17) | මාර්ගනාම පුවරු හා නාම පුවරු සකස් කිරීම. |
| B(06) | පැස්සුම් වැඩ, පේන්ට් වැඩ යකඩ වැඩ හා කම්මල්කරුවන්ගේ සේවා , ජලනල සේවා | B(18) | සියළුම වර්ගයේ කුෂන් වැඩ / තිර රෙදි |
| B(07) | කුලී රථ සේවා සැපයීම (වෑන් රථ) ස්කැවේටර් යන්ත්‍ර (pc 90,100,125) play loaded බර ඔසවන යන්ත්‍ර (Fork Lift) | B(19) | ජෙනරේටර් යන්ත්‍ර අළුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීම. |
| B(08) | ශබ්ද විකාශන යන්ත්‍ර හා උත්සව භාණ්ඩ සැපයීම. | B(20) | නීතිඥ සේවා,මිනින්දෝරු සේවා සහ උපදේශන සේවා |
| B(09) | වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම. (රථවාහන) | B(21) | ටයර් ටියුබ් මාරු කිරීම, පැච් දැමීම, වීල් එලයිමන්ට් කිරීම. |
| B(10) | වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම. (කාර්යාලීය) | B(22) | අනතුරුදායක ගස් කපා ඉවත් කිරීම. |
| B(11) | ආදාහනාගාර අළුත්වැඩියාව හා නඩත්තුව | B(23) | මෝටර් ග්‍රේඩර්, බැකෝ යන්ත්‍ර, ලෝඩර් හා මාර්ග තලන සේවා |
| B(12) | බෝතල් පත්තර අබිලි ද්‍රව්‍ය මිළ දී ගැනීම. | | |

## C ඉදිකිරීම්

| අයිතම අංකය | විස්තරය | අයිතම අංකය | විස්තරය |
|---|---|---|---|
| C(01) | ඉදිකිරීම් කොන්ත්‍රාත් හා ගොඩනැගිලි නඩත්තු වැඩ (රු.1,000,000.00 දක්වා) | C(02) | ඉදිකිරීම් කොන්ත්‍රාත් හා ගොඩනැගිලි නඩත්තු වැඩ (රු.1,000,000.00 වැඩි) |

කොන්දේසි

1. ඔබ විසින් සකස් කළ අයදුම්පත්‍රයක් මඟින් ඉහත සඳහන් එක් එක් වර්ගයන් සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළයුතු අතර, ඒ සඳහා වෙන් වෙන්ව ගාස්තු ගෙවිය යුතුය.
2. සැපයුම් සඳහා ලියාපදිංචි සැපයුම් කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවන්හි ඉන් බාහිර සැපයුම්කරුවන්ගෙන්ද මිල ගණන් කැඳවීමේ හා මිලදී ගැනීමේ අයිතිය කටාන ප්‍රාදේශීය සභාව සතුය.
3. නිසි පරිදී මිළ ගණන් ඉදිරිපත් කිරීමට හා කලට වේලාවට භාණ්ඩ සැපයීමට, නියමිත කාලයට, නියමිත පිරිවිතර හා ප්‍රමිතීන්ට කර්මාන්ත සිදු කිරීමට අපොහොසත් වන හා ඇණවුමේ සඳහන් විස්තර හා ආදර්ශයට අනුකූල මනා තත්වයෙන් යුතු භාණ්ඩ සැපයීම , ඉටු කිරීම පැහැර හරිනු ලබන සැපයුම්කරුවන්ගේ නම් ලියාපදිංචි නාම ලේඛනයෙන් ඉවත් කර අසාදු ලේඛනගත කරනු ලැබේ.
4. ව්‍යාපාරය නීත්‍යානුකූල වලංගු ලියාපදිංචියක් සහිත විය යුතු අතර ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ පිටපතක් අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතුය.
5. අයිතම අංක C 02 යටතේ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි කිරීමේ සහතිකය තිබිය යුතු අතර ලියාපදිංචි සහතිකයේ පිටපතක් අයදුම්පත සමඟ ඉදිරිපත් කල යුතුය.
6. 2024.11.29 දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කටාන ප්‍රාදේශීය සභාවේ දුරකථන අංක 031-2222575 මඟින් රාජකාරි වේලාව තුළ සැපයුම් නිලධාරි ඇමතීමෙන් ලබාගත හැකිය.

එම්.ඒ.එස්.සමන්ත,
ලේකම්,
කටාන ප්‍රාදේශීය සභාව,
දෙමංහන්දිය.
2024.10.30